**ශීර්ෂය - 294 ජාතික සත්වෝද්‍යාන දෙපාර් තමේන්තුව**

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 25 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 මැයි 24 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31දිනට ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු

අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප නොවන බව.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

#### (අ) පුනරාවර්තන වියදම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් වශයෙන් රු.586,163,912 ක් දක්වා තිබුණද ඒකාබද්ධ විස්තරාත්මක ශේෂ පිරික්සුම අනුව එම වියදම රු.608,650,360 ක් වී තිබුණි. ඒ අනුව රු.22,486,448 ක වෙනසක් විය. | ඉදිරි වර්ෂයේ ගිණුම පිළියෙල කිරීමේ දී මෙම වැය විෂයයන් පුද්ගල පඩි නඩි හා මෙහෙයුම් වියදම් යටතේ දැක්වීමට කටයුතු කරන බව දන්වමි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ පුනරාවර්තන වියදම්වලට අදාළ මුදල් ගලා යාම් නිවැරදිව හඳුනාගත යුතුය. |

#### (ආ) මූලධන වියදම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ භෞතික වත්කම් ඉදිකිරීම හෝ මිලදී ගැනීම හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් වශයෙන් රු.231,811,562 ක් දක්වා තිබුණද ඒකාබද්ධ විස්තරාත්මක ශේෂ පිරික්සුම අනුව එම වියදම රු.209,325,114 ක් වූයෙන් රු.22,486,448 ක වෙනසක් විය. | ඉදිරි වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේ දී මෙම වැය විෂයයන් පුද්ගල පඩි නඩි හා මෙහෙයුම් වියදම් යටතේ දැක්වීමට කටයුතු කරන බව දන්වමි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ප්‍රාග්ධන වියදම්වලට අදාළ මුදල් ගලා යාම් නිවැරදිව හඳුනාගත යුතුය. |

**(ඇ) දේපල පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2021 දෙසැම්බර් 31 දිනට ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව ස්ථාවර වත්කම් මිලදී ගැනීම සඳහා රු.209,325,114 ක් වැය කර තිබූ නමුත් මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශය අනුව එය රු.203,484,842 ක් වූයෙන් රු.5,840,272 ක වෙනසක් නිරීක්ෂණය විය. | වත්කම් සටහන් කිරීමේදී දෝෂ සහගත තත්ත්වයක් පැන නැඟී ඇති බැවින් ඒ සම්බන්ධයෙන් ඉදිරියේ දී රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවෙහි උපදෙස් ලබා ගෙන නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. | මූල්‍ය ප්‍රකාශනවල දක්වන මූල්‍ය නොවන වත්කම්වල නිවැරදි වටිනාකම දැක්වීමට කටයුතු කල යුතුය. |

**(ඈ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (i) **ඇප ලේඛනය** | | |
| මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරින් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | ඇප තැන්පත් කල යුතු නිලධාරීන් මේ වන විට හඳුනා ගෙන ඇති අතර බැංකු ගිණුම් විවෘත කර අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බව දන්වමි. | මුදල් රෙගුලාසි 891(1) සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වා ගත යුතුය. |
| (ii) **හානි පිළිබඳ ලේඛනය** | | |
| මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනය යාවත්කාලින කර නොතිබුණි. | වාහන අනතුරු සම්බන්ධ හානි හා පාඩු සටහන් කිරීමට ඉදිරියේ දී හානි හා පාඩු ලේඛනයක් ආයතන අංශය තුල පවත්වා ගෙන යාමට උපදෙස් දෙන ලද බව දන්වමි. | මුදල් රෙගුලාසි 110 හි විධිවිධාන ප්‍රකාර ඒ යටතේ වන ආකෘතිය අනුව හානි පිළිබඳ ලේඛනයක් පවත්වා ගත යුතුය. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 50 ට අනුකූලව වාර්ෂික වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වුවද දෙපාර්තමේන්තුව විසින් 2021 වර් ෂය සඳහා පිළියෙල කළ ඇස්තමේන්තුවේ වැය විෂයන් 08 ක සියයට 46 සිට සියයට 100 දක්වා පරාසයක ඉතිරිවීම් නිරීක්ෂණය විය. | 2021 වර්ෂය තුල රට තුල ව්‍යාප්ත වූ කොරෝනා වසංගත තත්ත්වයත් රට මුහුණ දී තිබූ ආර්ථික අර්බුදය හමුවේ අක් මුදල් නොලැබීමත් නව ව්‍යාපෘතින් හා මිල දී ගැනීම් අයවැය චක්‍රලේඛ මඟින් අත්හිටුවීමත් මත මෙම ප්‍රතිපාදන ඉතිරිවීම් සිදුව ඇති බව දන්වමි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිසි සැලසුමකින් හා කළමනාකාරීත්වයකින් යුතුව ඇස්තමේන්තු සකස් කිරීමට පියවර ගත යුතුය. |

2.2 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී විසින් දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, | අභ්‍යන්තර විගණන වාර්තා පිටපත් හා රැස්වීම් වාර්තා පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම සිදුකරනු ලබන බව දන්වමි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | නිරීක්ෂණය<br>වටිනාකම<br>රු. | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | | | |
| i. XIX පරිච්ඡේදයේ 6.1 ජේදය හා 7.2 ජේදය | | යම් තනතුරකට වෙන් කරන ලද නිවාසයක් හැර අනෙකුත් සියළුම නිවාස වල බදු කාලය වර්ෂ 05 ක් වීම හා නියමිත බදු කාලසීමාව ඉක්මවා නිවාසයක පදිංචිව සිටින කාලපරිච්ජේදය වෙනුවෙන් දණ්ඩන කුලියක් අය කර ගත යුතුය. ඊට පටහැනිව වර්ෂ 05 ක බදු පදනම මත ලබා දුන් නිල නිවාස 12 ක බදු කාල සීමාව ඉක්මවා වර්ෂ 06 සිට 33 දක්වා කාලයක් ගත වී තිබුණද දණ්ඩන කුලියද නොගෙවමින් නිලධාරීන් දෙපාර්තමේන්තුවේ නිල නිවාසවල රැඳී සිටින බව නිරීක්ෂණය විය. | දෙපාර්තමේන්තු අරමුණු ඵලදායී ලෙස ඉටුකර ගැනීමේ පදනම මත නිලධාරීන් සඳහා නිල නිවාස වෙන් කර දී ඇත. මෙම සුවිශේෂිතාවය සම්බන්ධව සඳහන් කරමින් නිල නිවාස සඳහා කුලිය අයකිරීම සම්බන්ධව ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ උපදෙස් ලබා ගෙන ඒ අනුව ඉදිරියේ දී කටයුතු කරනු ලබන බව දන්වමි. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| ii. XIX පරිච්ඡේදයේ 7.1 ඡේදය | නිවාසයෙන් අස් වී යන ලෙස නිලධරයකුට නියම කල විට ඔහු එසේ නොකළහොත් 1971 අංක 03 හා 1974 අංක 40 දරන පනත් වලින් සංශෝධිත 1969 අංක 07 දරන රජයේ නිවාස (සන්තකය ආපසු ලබා ගැනීමේ) පනත යටතේ ඔහු එම නිවාසයෙන් ඉවත් කළ යුතුය. එසේ වුවද බදු කාලය වසර 05 ඉක්මවා ගිය නිලධාරීන් 12 ක් වෙත ඉවත්ව යන ලෙස දන්වා තිබුණද ඒ සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි. ඒ හේතුවෙන් පොරොත්තු ලේඛනයේ රැඳී සිටි අනෙකුත් නිලධාරීන්හට නිල නිවාස ලබා ගැනීමේ වරප්‍රසාදය අහිමි වී ඇති බව නිරීක්ෂණය විය. | -එම- | -එම- |
| iii. XIX වෙනි පරිච්ඡේදයේ 8.2 වගන්තිය | නිල නිවාසයේ නඩත්තුව පිළිබඳ වගකීම පැවරී ඇති බලධරයන් අනෙකුත් උපකරණ සහ සවිකුරු යනාදිය පිළිබඳ ඉන්වෙන්ට්‍රියක් තබා ගත යුතු වුවද දෙපාර්තමේන්තුව විසින් එවැනි ඉන්වෙන්ට්‍රියක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. | සියළුම නිල නිවාස වල උපකරණ හා සවිකුරු යනාදිය මේවන විට ඉන්වෙන්ට්‍රි ගත කිරීමට කටයුතු කරමින් පවතින බව දන්වා සිටිමි. | -එම- |
| iv. XIX පරිච්ඡේදයේ 5:2 හා 5:3 වගන්ති | නිල නිවාසයක පදිංචි වීම වෙනුවෙන් නිලධරයාගේ වැටුපෙන් අයකර ගත යුතු නිවාස කුලී ප්‍රතිශතය සියයට 7.5, | දෙපාර්තමේන්තු අරමුණ ඵලදායී ලෙස ඉටුකර ගැනීමේ පදනම මත නිලධාරීන් සඳහා නිල නිවාස වෙන් කර දී ඇත. මෙම සුවිශේෂිතාවය | -එම- |

| | | | |
|---|---|---|---|
| | සියයට 10, සියයට 12.5 වශයෙන් වෙන් වෙන් ව දක්වා ඇතත් සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව විසින් දෙහිවල සත්වෝද්‍යානයේ පවතින නිවාස 25 වෙතින් ම නිලධාරීයාගේ වැටුපෙන් සියයට 12.5 ක් අයකර තිබුණි. | සම්බන්ධව සඳහන් කරමින් නිල නිවාස සඳහා කුලිය අයකිරීම සම්බන්ධව ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ උපදෙස් ලබා ගෙන ඒ අනුව ඉදිරියේ දී කටයුතු කරනු ලබන බව දන්වමි. | |
| (ආ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| i. මුදල් රෙගුලාසි 104(3) හා 104(4) | වාහන අනතුරක් සිදු වීමෙන් පසු පරිපූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීමට දින 07 කට වැඩි ප්‍රමාදයක් සිදු වේ යැයි අපේක්ෂා කරන්නේ නම් ප්‍රාරම්භක වාර්තාවක් වහාම යැවිය යුතු අතර අලාභ හානිය සිදු වූ දිනයේ සිට තුන් මසක් ඇතුළත පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වුවද වාහන අනතුරු හා අලාභ හානි සිදු වූ අවස්ථා 14 කදී එලෙස කටයුතු කර නොතිබුණි. | වාහන අනතුරු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 (3) හා 104 (4) අනුව කටයුතු කිරීමට ආයතන අංශය වෙත උපදෙස් ලබා දීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| **ii.** මුදල් රෙගුලාසි 396 | සමාලෝචිත වර්ෂය අවසන් වන විට නිකුත් කර මාස 06 ක් ඉක්ම වූ එකතුව රු.82,446 ක් වූ චෙක්පත් 15 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් චෙක්පත් ලැබීමේ ප්‍රමාදයන් නිසා මෙම තත්වය ඇති වූ බවත් 2022 මැයි මස අවසානයේ එම චෙක්පත් ගෙවීමට ඉදිරිපත් නොවුන හොත් රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කරන බවත් දන්වමි. | -එම- |

| | | | |
|---|---|---|---|
| **iii.** මුදල් රෙගුලසි 571 | වසර 02 ඉක්ම වූ රු.43,290,219 ක් වූ පොදු තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | වසර 02 ඉක්ම වූ තැන්පත් සම්බන්ධයෙන් අදාළ ආයතන දැනුවත් කිරීමට මේ වනවිට කටයුතු කරමින් පවතින අතර මසක් ඇතුළත හිමිකම් පෑම සිදුනොකරන ලද තැන්පතු රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කරනු ලබන බව දන්වා සිටිමි. | -එම- |
| **(ඈ)** 2016 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 30/2016 | ඉන්ධන පරිභෝජනය, ලොග් සටහන් පොත් පවත්වා ගැනීම, ඉන්ධන කාර්යක්ෂමතාවය මැන බැලීම චක්‍රලේඛය ප්‍රකාරව සියලුම වාහනවල සිදු කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කරන ලෙස දෙපාර්තමේන්තුවට අයත් සියලුම උප ආයතනයන් දැනුවත් කිරීමට කටයුතු කරන බව දන්වමි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 270/2019 | එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි දෙපාර්තමේන්තු බදු ගිණුම්ගත කිරීම සඳහා අංක 9185 දරන එකතු කළ අගය මත බදු පාලන ගිණුම පවත්වා ගත යුතු වුවත් එලෙස කටයුතු කර නොතිබුණි. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවෙහි උපදෙස් මත සිගාස් පරිගණක පද්ධතිය මඟින් එකතු කළ අගය මත බදු පාලන ගිණුම පිළියෙල කිරීම සිදුකර වර්ෂය අවසානයට ප්‍රථම බදු ගිණුම් ගත කිරීම සිගාස් පද්ධතිය මඟින් සිදුකිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | -එම- |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව විසින් ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය | ආයතනය වෙත ගෙවන ලද බිල්පත්වලට අදාළ රඳවා ගැනීම් ද දෙපාර්තමේන්තුව සතුව පවතින | නිම නොකර අත්හැර දමා ඇති මෙම ඉදිකිරීම් කඩිනමින් සම්පූර්ණ කර ගැනීමට |

| | | |
|---|---|---|
| සමඟ එළඹ තිබූ ගිවිසුම් පරිදි එම ආයතනය කටයුතු නොකිරීම හේතුවෙන් ව්‍යාපෘති 06 කට අදාළව කොන්ත්‍රාත්තු අවසන් කිරීමට (Terminate) ප්‍රසම්පාදන කමිටුව තීරණය කර තිබූ අතර එම ව්‍යාපෘති නැවත නව කොන්ත්‍රාත්කරුවකුට ලබා නොදී අතරමඟ නවතා දමා තිබුණි. එම ඉදිකිරීම් වෙනුවෙන් 2021 දෙසැම්බර් 31 දින වන විට රු.69,558,270 ක වියදමක් දරා තිබූ අතර ඉන් සමහර ව්‍යාපෘති වෙනුවෙන් ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය වෙත ලබා දී තිබූ Mobilization Advance මුදලෙන් රඳවා ගැනීම් මුදල් ගැලපීමෙන් පසු රු.14,360,310 ක මුදලක් අය කර ගත යුතුව තිබුණි | බැවින් දෙපාර්තමේන්තුව වෙත ලැබිය යුතු අලාභය අය කර ගැනීමට හැකියාව පවතින අතර මේ වන විට එම ආයතනය විසින් අත්හරින ලද ව්‍යාපෘතීන් සිවිල් ආරක්ෂක බලකාය මඟින් එක් එක් ව්‍යාපෘතිය ලෙස ඉදිකිරීම් කටයුතු සිදුකරමින් පවතින බව දන්වමි. | කටයුතු කළ යුතුය |

**3.2 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 වර්ෂයේදී අවසන් වීමට නියමිතව තිබූ ඇස්තමේන්තු ගත පිරිවැය රු.20,084,630 ක් වූ ගෝණපල ගොවිපළේ ඉදිකළ සත්ව සංරක්ෂණ මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කටයුතු 2021 වර්ෂය අවසන් වන විටත් අවසන් කර නොතිබුණි. ඒ සඳහා සමාලෝචිත වර්ෂය අවසන් වන විට රු.14,309,453 ක් අදාල කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. | ගෝනපොල ගොවිපලේ සත්ව සංරක්ෂණ මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කටයුතු සිදුකිරීමේ ප්‍රමාදය මත එම කොන්ත්‍රාත්තුව අවසන් කිරීමට ප්‍රසම්පාදන කමිටුව තීරණය කර ඇති බවත් එම ඉදිකිරීමේ ඉතිරි වැඩ දෙපාර්තමේන්තු සේවකයින් යොදවා ඉදිරියේ දී අවසන් කිරීමට බලාපොරොත්තු වන බව දන්වමි. | කඩිනමින් ඉදිකිරීම්වල වැඩ අවසන් කර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.3** කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වාහන 08 ක් 2014 හා 2019 වර්ෂවල සිට 2022 මාර්තු දක්වාම නිෂ්ක්‍රියව පවතින අතර එම වාහන අපහරණය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මෙම වාහන අපහරණය කිරීම සඳහා වාහනවල මිල ගණන් තක්සේරු කිරීම සඳහා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙන් අදාල නිලධාරීන් ලබා ගැනීම සඳහා 2022.04.20 දින එම දෙපාර්තාමේන්තුව වෙත ලිපි යවා ඇති අතර අපහරණය කිරීමේ කටයුතු කඩිනමින් නිම කිරීමට කටයුතු කරන බව දන්වමි. | වාහන අපහරණ කටයුතු කඩිනමින් නිම කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | කැබ් රථයක අනතුර රියදුරුගේ වරදින් සිදුව ඇති බව 2021 සැප්තැම්බර් 11 වන දින ස්ථානාධිපති, මූලස්ථාන පොලිසිය, මිරිහාන මඟින් නිකුත් කර ඇති පොලිස් වාර්තාව අනුව තහවුරු වුවද එම අලාභය සිදුව ඇත්තේ නිලධාරියාගේ ප්‍රමාදයක්, නොසැලකිල්ලක්, වරදක් හෝ වංචාවක් හේතු කොට ගෙනද යන්න සොයා බලීම සඳහා මුදල් රෙගුලාසි 156(i) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මෙම වාහන අනතුර සම්බන්ධයෙන් මු.රෙ 156(**i**) අනුව මේ වන විට කටයුතු කරමින් පවතින බව කාරුණිකව දන්වා සිටින අතර වරින් වර අමාත්‍යාංශ වෙනස් වීම මත මෙහි ප්‍රමාදයන් සිදු ව ඇති බව දන්වමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | වාහන අලුත්වැඩියා කටයුතු සිදු කිරීමට පෙර එම අලුත්වැඩියා කටයුතු සිදු කිරීමේ අවශ්‍යතාවය තහවුරු කිරීම සඳහා කාර්මික නිලධාරිවරයකුගේ විධිමත් | සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවෙහි පවතින අත්‍යාවශ්‍ය තත්ත්වයත්, කොරෝනා වසංගත තත්ත්වයත්, කාර්මික නොවන ඇතැම් අලුත්වැඩියා සඳහාත් | වාහන අලුත්වැඩියා කටයුතු සිදු කිරීමේදී කාර්මික නිලධාරිවරයෙකුගේ විධිමත් නිර්දේශයක් ලබා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | නිර්දේශයක් ලබා ගත යුතු වුවත් අවස්ථා 32 කදී එසේ කටයුතු කර නොතිබූ බව නිරීක්ෂණය විය. | ඇතැම් අවස්ථාවල දී කාර්මික නිලධාරිගේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව අලුත්වැඩියා කටයුතු සිදුකර ඇති අතර ඉදිරියේ දී මෙවැනි තත්ත්වයන් වලක්වා ගන්නා ලෙස සියලුම ආයතන දැනුවත් කිරීමට කටයුතු කරන බව දන්වමි. | |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධාන සංශෝධනය කළ හැක්කේ එම නීතිය පැනවූ අධිකාරියට පමණක් වුවත්, බදු කාලය ඉක්මවා නිවාසයක පදිංචිව සිටින කාලපරිච්ඡේදය වෙනුවෙන් දණ්ඩන කුලියක් අයකර ගත යුතුය යන ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 7.2 ඡේදය, සේවා අවශ්‍යතාවය මත උපලේඛන ගත වී සිටින නිල නිවාසලාභී නිලධාරීන් හට අදාල නොවන බව සඳහන් කරමින් අධ්‍යක්ෂ ජනරාල් විසින් 2016 ජූලි 17 දිනැති හා අංක NGD/AD/02/Quart/20 (Vo 1.1) දරන ලිපිය නිකුත් කර තිබුණි. | දෙපාර්තමේන්තු අරමුණ ඵලදායී ලෙස ඉටුකර ගැනීමේ පදනම මත නිලධාරීන් සඳහා නිල නිවාස වෙන් කර දී ඇති අතර මෙම සුවිශේෂිතාවය සම්බන්ධව සඳහන් කරමින් නිල නිවාස සඳහා කුලිය අයකිරීම සම්බන්ධව ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ උපදෙස් ලබා ගෙන ඒ අනුව ඉදිරියේ දී කටයුතු කරනු ලබන බව දන්වමි. | ආයතන සංග්‍රහයේ විධිවිධාන අභිබවා කටයුතු නොකළ යුතුය. |
| (ඉ) | 2016 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාලය තුළ ගෝනපළ ගොවිපල තුල වගා කිරීමේ කටයුතු නිසි සැලැස්මකට අනුව සිදු කර නොතිබූ අතර එහි වගාව වැඩි කර බාහිර ආයතනයන්ගෙන් මිලදී ගන්නා සත්ව ආහාර ප්‍රමාණය අඩු කර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ඉදිරියේ දී සත්ව ආහාර වියදම අවම කර ගැනීමේ අරමුණින් දෙපාර්තමේන්තුවට අවශ්‍ය, පහසුවෙන් වගා කල හැකි, ඉක්මන් ඵලදාව ලබා ගත හැකි බෝග වර්ග හඳුනාගෙන ගෝනපොල ගොවිපොල සැලැස්ම සංශෝධනය කිරීමට කටයුතු කරමින් පවතින බව දන්වමි. | ගොවිපළ තුළ වැඩි ඵලදාවක් ලැබෙන ආකාරයට නිසි සැලසුමක් අනුව වගා කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | පින්නවල අලි අනාථාගාරයේ අලින් රඳවා සිටින ස්ථාන අසල අලි වසුරු හා ඉතිරි වූ ආහාර කොටස් ගොඩ ගසා තිබූ බැවින් පරිශ්‍රය අපවිත්‍රව පැවතුණි. | වර්ෂා කාලයන්හි දෙපාර්තමේන්තු සේවකයින් යොදවා අලිවසුරු ඉවත් කිරීමේ අපහසුතාවයක් පවතින බවත් මෙම තත්ත්වය අලි වසුරු ඇඹරීමේ යන්ත්‍රය සකස් කල පසු අවම කර ගැනීමට හැකියාව පවතින බවත් දන්වමි. | අලි වසුරු හා ඉතිරි වූ ආහාර කොටස් ඉවත් කිරීම සඳහා වැඩ පිළිවෙලක් යෙදිය යුතුය. |

**4.** **මානව සම්පත් කළමනාකරණය**

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | --------------------- | ------------------------------ | ------------- |
| (අ) | දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු තනතුරු 153 ක් වූ අතර ඉන් ද්වීතික මට්ටමේ තනතුරු 04 ක පුරප්පාඩු පැවතීම හේතුවෙන් දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් කාර්යක්ෂමතාවය අවම මට්ටමක පැවතුණි. | දෙපාර්තමේන්තුවෙහි ද්විතියික මට්ටමේ පවතින පුරප්පාඩු 04 ක් සම්පූර්ණ කිරීම සඳහා මේ වන විට කටයුතු කරමින් පවතින බව කාරුණිකව දන්වා සිටිමි. | පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීම් සිදුකිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ආයතන සංග්‍රහයේ III වන පරිච්ඡේදය අනුව සහ 2009 පෙබරවාරි 20 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1589/30 අංක දරන අති විශේෂ ගැසට් නිවේදනයේ පළකර ඇති රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ XVIII පරිච්ඡේදයේ උපදෙස් අනුව රාජ්‍ය සේවයේ එකම ස්ථානයක දීර්ඝ සේවා කාලයක් සම්පූර්ණ කරන නිලධාරීන් ස්ථාන මාරුවීම්වලට යටත්වන නමුත් දෙපාර්තමේන්තුවේ සේවයේ නියුක්ත සංවර්ධන නිලධාරීන් 30 ක්, කළමනාකරණ සේවා නිලධාරීන් 09 ක් සහ කනිෂ්ඨ සේවකයන් 11 දෙනෙකු වර්ෂ 05 සිට වර්ෂ 15 දක්වා කාල පරාසයක් අඛණ්ඩව දෙපාර්තමේන්තුවේ සේවයේ නියුක්තව තිබුණි. | වර්ෂ 05 ඉක්මවන ලද නිලධාරීන් වාර්ෂික ස්ථාන මාරු අයඳුම් කර ඇති අතර, ඔවුන්ගේ සමස්තයකට ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක වූවත්, විවිධ හේතූන් මත අනෙකුත් නිලධාරින්ගේ ස්ථාන මාරු අවලංගු වී ඇති බව දන්වමි. | වාර්ෂික ස්ථාන මාරු විධිමත් පරිදි සිදු කිරීමට කටයුතු කළ යුතුය. |